රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 10/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 මාර්තු මස 03 වෙනි දින.

**සියලුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
පළාත් සභා මහ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිසාපතිවරුන් වෙත.

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක නොකිරීම.

මේ සම්බන්ධව නිකුත් කර ඇති 1991 ජූලි මස 14 වෙනි දිනැති අංක. 28/91, 1991 අගෝස්තු මස 27 වැනි දිනැති අංක. 38/91, 1991 දෙසැම්බර් මස 13 වැනි දිනැති අංක. 59/91 සහ 1991 දෙසැම්බර් මස 25 වැනි දිනැති අංක. 60/91 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1992 ජනවාරි මස 22 වැනි දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සමහර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ක්‍රියා කර නොමැති බවත්, මේ සම්බන්ධව අදාල නිලධාරීන්ට උපදෙස් නිකුත් කළයුතු බවටත් තීරණය කර ඇත.

03. ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන පැහැදිලිව අර්ථ නිරූපනය කිරීම හෝ යම් සංශෝධනයක් දැන්වීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විටින් විට නිකුත් කරනු ලබයි. ආයතන සංග්‍රහයේ මෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධාන ද තරයේ පිළිපැදීම සහතික වීම ඔබගේ වගකීම වන අතර, ඔබ අමාත්‍යාංශයේ මෙන්ම ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන තුළ ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔබ සතු වන බවත්, අවධාරණයෙන් පෙන්වා දෙනු කැමැත්තෙමි. රාජ්‍ය සේවය ක්‍රමවත්ව මෙන්ම සතුටුදායකව පවත්වාගෙන යාම පිණිස මෙය අත්‍යවශ්‍ය කරුණක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

04. සෑම රාජ්‍ය නිලධාරියෙකු ම තම සේවා කොන්දේසි අනුව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට බැඳී ඇති නිසා එය අනුගමනය කිරීම පැහැර හරින නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීම ඔබේ වගකීම වේ.

05. එබැවින් මෙම චක්‍රලේඛ උපදෙස් තදින් ම ක්‍රියාත්මක කිරීමට වගබලා ගනු මැනවි.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.